**09-03-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පරමාත්ම පියාගේ චරිත කොටස සැමටම යහපත සැලසීම වන්නාක් සේම ඔය දරුවනුත් පියා සේම යහපත සලසන්නන් විය යුතුයි. තමාටත් අන් සැම කෙනෙකුටමත් යහපත සලසාගන්න.

**ප්‍රශ්නය:** දරුවන්ගේ කුමන සුවිශේෂී ගති ලක්ෂණය දැකීමෙන් ද බාප්දාදා ඉතාමත් සතුටට පත් වනනේද?

**පිළිතුර:** දුප්පත් දරුවන් රුපියලක් ශත පනහක් යගියාවට එවනා විට: බාබා මේ වෙනුවට මට මාළිගාවක් දෙන්නැයි කියා කියනවා. බාබා කියනවා: දරුවනි, මේ එක රුපියලත් ශිව බාබාගේ නිදන් ගබඩාවට එකතු වෙනවා. ඉන් ඔබ අපත් 21 කට මාළිගාවක් ලබාවි. සුදාමාගේ ආදර්ශ කතාව තිබෙනවා. සිප්පි කටුවක තරමේ දෙයක්වත් වියදම් නොකර ඔබ ලෝක ආධිපත්‍යය දිනා ගන්නවා. දුප්පත් දරුවන්ගේ මෙම සුවිශෙෂී ගති ලක්ෂණ දැකීමෙන් බාබා බොහෝ සතුටට පත් වෙනවා.

**ගීතය:** ඔබ සොයා ගැනීමෙන් අප මුළු ලොවම ලැබුවෙමු. අහසත් පොළොවත් සියල්ල අයිති අපටයි.

ඕම් ශාන්ති. ඔය සුමිහිරිම දරුවන් දැන් තේරුම් ගෙන සිටිනවා තමන් දැන් තම අසීමිත උරුමය බාබාගෙන් දිනා ගනිමින් සිටිනා බව. දරුවන් කියනවා: බාබා ඔබගේ ශ්‍රීමත් පිළිපැදීමෙන් අප නැවතත් වතාවක් අපගේ උරුමය ඔබගෙන් හිමි කර ගන්නවා. මෙය අලුත් දෙයක් නොවෙයි. ඔය දරුවන්ට දැනුම ලැබී තිබෙනවා. සෑම කල්පයකදීම සතුටු දේශයේ උරුමය ඔබ දිගටම ලබනා බව ඔබලා තේරුම් ගෙන සිටිනවා. සෑම කල්පයකදීම ඔබ උපත් 84 ක් ළද යුතුයි. අපි සැබැවින්ම අපගේ අසීමිත පරමාත්ම පියාගෙන් උපත් 21 කට අපගේ උරුමය දිනා ගෙන පසුව ක්‍රම ක්‍රමයෙන් එය අහිමි කර ගන්නවා. මෙම නාටකය සදාකාලයටම තීරණය වී ඇත්තක් බව පරමාත්ම පියා පැහැදිලි කර කියා දෙනවා. ඔය දරුවන්ට මෙම සහතිකය තිබෙනවා. නාටකයේ විශාල සතුටක් ඇති බවත් ඔය දරුවන් දන්නවා. එහි අවසානයේදී ඔබ රාවනගෙන් දුක ලබනවා. මේ මොහොත වන විට සිටින්නේ ඔබගෙන් කිහිප දෙනෙක් පමණයි. තවදුරටත් ඉදිරියට යන විට මෙය බොහෝ සෙයින් ව්‍යාප්ත වේවි. ඔබලා මානව තත්වයෙන් දේවතාවරුන් බවට වෙනස් වෙනවා. සෑම කල්පයකදීම තමන් පරමාත්ම පියාගෙන් තම උරුමය දිනා ගත් බව ඔබලා අනිවාර්යෙන්ම දන්වා. මෙහි පැමිණ මෙම ඥානය ගන්නා අය තමන් මෙම ලෝකයේ මුල, මැද හා අග පිළිබඳ වූ දැනුම ලැබුවේ ඥාන සාගරය වන පරමාත්ම පියාගෙන් බව අවබෝධ කර ගනීවි. ඥාන සාගරය හා අපිරිසිදු අය පාරිශුද්ධ කරවන පාරිශුද්ධකරු මෙන්ම මුක්තිය හා ජීවන මුක්තිය වෙතට ඔබව ගෙන යන්නේ පරමාත්ම පියාම පමණයි. මේ ගැන ඔබ දන්නේ මේ කාලයේදි පමණයි. බොහෝ අය ගුරුන් සොයාගෙන සිටිනවා. අවසානයේදී ඔවුන් ඒ සියලු දෙනා අතහැර දමා මෙහි පැමිණ ඥානය ගනීවි. ඔබලාත් දැන් මෙම ඥානය ලබා සිටිනවා. මීට පෙර තමනුත් කිසිවක් නොදැන සිටි බව ඔබලා දන්නවා. ලෝක චක්‍රය කරකැවෙන්නේ කෙසේද? ශිව බාබා කවුද? බ්‍රහ්මා, විෂ්ණු, ශංකර් කවුදැයි කියා ඔබ දැන සිටියේ නැහැ. තමන් ලෝක පාලකවරුන් ලෙසින් සිටි බව ඔබලා දැන් දන්නා නිසා ඉතාමත් ඉහළ කුල්මත් බවක් ඔබලාට තිබිය යුතුයි. නොනවත්වාම පරමාත්ම පියාවත් ලෝක චක්‍රයත් කරකවන්න: ඇල්ෆා හා බීටා පරමාත්ම පියා පැහැදිලි කර කියනවා: මීට පෙර ඔබලාත් කිසිම දෙයක් දැන සිටියේ නැහැ. ඔබ පරමාත්ම පියා ගැන දැනගෙන සිටියේත් නැහැ. ඔහුගේ නිර්මාණය ගැන දැන සිටියේත් නැහැ. ලෝ වැසියන් පරමාත්ම පියාව දන්නේත් නැහැ. එම නිර්මාණයේ මුල, මැද හා අග ගැන දන්නේත් නැහැ. ඔබලා දැන් බ්‍රාහ්මණ තත්ත්වයෙන් ශුද්‍රයින් වෙලා. පරමාත්ම පියා කතා කරන්නේ සියලුම දරුවන්ටයි. දරුවන් ගණනාවකුත් මධ්‍යස්ථාන ගණනාවකුත් තිබෙනවා. දැන් තව තවත් මධ්‍යස්ථාන විවෘත වේවි. පරමාත්ම පියා පැහැදිලි කර කියනවා: මීට පෙර ඔබ කිසිම දෙයක් දැන සිටියේ නැහැ. දැන් ඔබ දරනා උත්සාහයේ තරමට යම් දෙයක් ඔබට තේරෙනවා. තමන්ව දැන් පරමාත්ම පියා විසින් අපිරිසිදු බවින් පිරිසිදු කරවමින් සිටිනා බව ඔබලාට තේරෙනවා. අන් අය තව තවත් කන්නලව් කරමින් සිටිනා අතර ඔබලා අදෘශ්‍යමානයි. බ්‍රහ්ම කුමාරයින් හා කුමාරීන් ගැන කතා කළත් ඔවුන්ට උගන්වන්නේ කවුදැයි කියා ඔවුන් දන්නේ නැහැ. මේ දේවල් කිසිම ග්‍රන්ථයක සඳහන් වී නැහැ. ගීතාවේ ඒ ශිව දෙවියන්ම පැමිණ ඔය දරුවන්ට රාජයෝගාව ඉගැන්වූවා. මෙය ඔබගේ බුද්ධියට වැටහෙනවා. ඔබලා ගීතාව හදාරා ඇති. ඥානප මාර්ගය මුළුමනින්ම

වෙනස් මාර්ගයක් බව දැන් ඔබට තේරෙනවා ඇති. ග්‍රන්ථ හැදෑරීමෙන් විද්වත් මණ්ඩලයේ සැම කෙනෙක්ම ලබා ගන්නා දැනුම භක්ති මාර්ගයට අයත් පොත්පත් වල දැනුමයි. මෙම ඥානය ඒ පොත්පත් වල නැහැ. නිර්මාණයේ මුල, මැද හා අග පිළිබඳ වූ ඥාන සම්භාරය ඔබලාට දෙන්නේ පරමාත්ම පියා පැමිණි විට පමණයි. පරමාත්ම පියා පැමිණ ඔබලාගේ බුද්ධියේ අගුළු විවෘත කර තිබෙනවා. මීට පෙර ඔබ සිටියේ කෙසේද, දැන් පත්ව සිටින්නේ කුමන තත්ත්වයකටදැයි කියා ඔබ දන්නවා. මුළු කල්පයම ඔබගේ සිහියට ඇතුළු වී තිබෙනවා. මුලදී ඔබ මෙය අවබෝධ කර ගත්තේ නැහැ. දවසින් දවස ඥානයේ තෙවෙනි ඇස ඉතාමත් හොඳින් විවර වෙනවා. පරමාත්මය පැමිණියේ කවදාද යන්නවත් ගීතාවේ ඥානය දුන්නේ කවුද කියාවත් මිනිස්සු දන්නේ නැහැ. ඔය දරුවන් දැන් දන්නවා. මුළු කල්පයේම දැනුම ඔබගේ බුද්ධියේ තිබෙනවා. ඉණිමගේ ඉහළ පහළ යන අතර පාප මාර්ගයට ඔබ ඇද වැටුණේ කෙසේද යන්නත් පාරිශුද්ධකරු කවුද, තමාව අපිරිසිදු කෙරෙව්වේ කවුද යන සියල්ලම පින්තූර වල ඉතාමත් හොඳින් පැහැදිලි කර පෙන්වා දී තිබෙනවා. ඔබ දැනු මෙය දන්නවා. නමුත් ඔවුන් නොනවත්වාම “පාරිශුද්ධකරුවාණෙනි” කිය කියා ගීත ගායනා කරමින් සිටිනවා. රාවණ රාජ්‍යය ඇරඹෙන්නේ කවදාද, තමන් අපිරිසිඳු වන්නේ කවදාදැයි කියා ඔවුන්ට අවබෝධ වී නැහැ. මෙම ඥානය ඇත්තේ ආදි සනාතන දේවි දේවතා ධර්මයේ අයටයි. පරමාත්ම පියා කියනවා: ආදි සනාතන දේවි දේවතා ධර්මය ස්ථාපනය කළා. ලෝකයේ ඉතිහාසය හා භූගෝලය ගැන ඔබට පහදා දීමට පරමාත්ම පියාම හැරෙන්න වෙන කිසිම කෙනෙකුට බැහැ. මෙය ඔබට කතාන්දරයක් වගේයි. අප රාජධානිය ලැබුවේ කෙසේද, පසුව එය අහිමි වූයේ කෙසේද යන්න පිළිබඳ වන ඉතිහාසය හා භූගෝලය අප දැන් ඉගෙන ගනිමින් සිටිනවා. මෙය අසීමිත වූ කරුණකි. උපත් 84 චක්‍රය වටා අප යන්නේ කෙසේද, ලෝක පාලකවරුන් වන්නේ කෙසේද, පසුව රාවණ අපෙන් ඒ රාජ්‍යය උදුරා ගන්නේ කෙසේද යන සම්පූර්ණ ඥාන සම්භාරය දෙන්නේ පරමාත්ම පියාම පමණයි. මිනිස්සු දශේරාව (රාවණගේ පඹයෙක් සාදා පිළිස්සීම) සැමරුවත් ඔබට මෙම දැනුම තිබුණේ නැතිවාක් සේම ඔවුන්ටත් කිසිම ඥානයක් නැහැ. නමුත් දැන් ඔබට මෙම ඥානය තිබෙනා නිසා ඔබ සිටින්නේ සතුටිනුයි. දැනුම සතුට ගෙන එනවා. ඔබගේ බුද්ධියේ අසීමිත ඥානයක් තිබෙනවා. පරමාත්ම පියා දැන් ඔබගේ ඒප්‍රන ප්‍රරවාලනවා. අපගේ ඒප්‍රන පුරවන්නැයි කියා ඔවුන් ඉල්ලා සිටිනවා. ඔවුන් මෙසේ කියන්නේ කාටද? සාදු සන්නාසිවරුන් මෙසේ කියන්නේ නැහැ. ඔවුන් මෙසේ කියන්නේ අහිංසක ශිව පරමාත්මයටයි. ඔහුගෙන් ඔවුන් ආධාර ඉල්ලනවා. ඔබගේ සතුටට දැන් සීමාවක් නැහැ. ඔබට ලොකු සතුටක් තිබිය යුතුයි. ඔබගේ සිහියේ විශාල දැනුම් සම්භාරයක් තිබෙනවා. අසීමිත සතුටක උරුමය ඔබ අසීමිත පරමාත්ම පියාගෙන් ලබා ගන්නවා. දැන් තමන්ටත් අන් අයටත් යහපත සලසන්න. සැම කෙනෙකුටම යහපත සලසන්න. මීට පෙර ඔබ සැම කෙනෙක්ම එකිනෙකාට පාඩු, හානි කර ගනිමින් තමයි සිටියේ. මන්ද, ඔබලා සිටියේ යක්ෂයින්ගේ මත අදහස් පිළිපදිමිනුයි. දැන් ඔබ ශ්‍රීමත් පිලිපදිනා නිසා තමාටම යහපතක් කර ගැනීමට ඔබට පුළුවනි. සැම කෙනෙකුටම මෙම අසීමිත දැනුම හදාරා නොනවත්වාම මධ්‍යස්ථාන විවෘත විය යුතුයි යන්න තමයි ඔබගේ හදවතේ ආසාව. දරුවන් කියනවා: බාබා, අපට ප්‍රදර්ශනයක් දෙන්න. ප්‍රොජක්ටරයක් දෙන්න. අපි මධ්‍යස්ථානයක් විවෘත කරන්නම්. ඥානය නිසා ඉහළ නැංවුණු අපගේ සතුටේ රසදිය කඳේ අත්දැකීම අපි අන් අයටත් දෙන්නම්. නාටකයට අනුව මෙම උත්සාහයක් දිගටම කෙරීගෙන යනවා. පරමාත්ම පියා පැමිණ සිටින්නේ නැවතත් වතාවක් භාරතය දිව්‍ය ලෝකය කරවීමටයි. තමන් මීට පෙර අපායේ වැසියන්ව සිටි බවත් දැන් දෙව්ලොව වැසියන් වෙමින් සිටිනා බවත් ඔබලාට තේරෙනවා. ඔබ නිරන්තරයෙන්ම නිතරම මෙම ඥානය ඔබගේ බුද්ධියේ කරකැවිය යුතුයි. මෙසේ කිරීමෙන් ඔබ තුළ නිරන්තර සතුටක් රඳේවි. අන් අයට පැහැදිලි කිරීමේ කුල්මත් බවක් ඔබ තුළ තිබිය යුතුයි. අප මෙ දැනුම පරමාත්ම පියාගෙන් ලබනවා. මේ ගැන නොදන්නා ඔබගේ සහෝදර සහෝදරියන්ට මෙම මාවත පෙන්වා දීම ඔබගේ රාජකාරියයි. සැම කෙනෙකුටම යහපත සැලසීම පරමාත්ම පියාගේ චරිත කොටස වී ඇත්තාක් සේ අප සැම කෙනෙකුගේම චරිත කොටස වන්නේද සියල්ලට යහපත සැලසීමයි. බාබා අපව යහපත සලසන්නන් බවට පත් කරවා තිබෙනවා. එමනිසා අපි අපටත් අන් අයටත් යහපත සලසා ගන්නවා. පරමාත්ම පියා කියනවා: මේ මේ මධ්‍යස්ථානයට ගොස් සේවය කරන්න. එක තැනකට වී සිටින්න එපා. කෙනෙක් වඩාත් දක්ෂ වන තරමට සැම තැනකම සේවය කිරීමට ඔහු වඩ වඩාත් ආසා වෙනවා. අයවල් වීදියේ අලුත් මධ්‍යස්ථානයක් විවෘත වී තිබෙනවා. කවුද වඩාත් හොඳින් සේවය කළ හැකි කීකරු, විශ්වාසවන්ත හා සැම අණක්ම පිලිපදින අය කියා ඔබ දන්නවා. අඥාන මාර්ගයේ දී පවා පියෙක් තම අකීකරු දරුවන්ට කැමති නැහැ. අසීමිත පියා කියනවා: මම ඉතාමත් සරළව ඔබට සියල්ල පැහැදිලි කර කියා දෙනවා. මේ ගැන බිය වීමට කාරණාවක් නැහැ. මෙය කරනා කෙනා කවුරු වුවත් ඔහුට එහි ඵලය ලැබේවි. සාප කිරීමේ හෝ අකමැති වීමේ කියා හෝ දෙයක් නැහැ. පරමාත්ම පියා පැහැදිලි කර කියනවා: ඇයි ඔබ හොඳින්

සේවය කර තමන්ටත් අන් අයටත් යහපත සලසා ගන්නේ නැත්තේ? වැඩි වැඩියෙන් අන් අයට යහපත සැලසූ තරමට බාබාත් ඔබ ගැන වඩාත් සතුටු වෙනවා. ගෙවත්තේ මේ මල නම් හොඳයි කියා බාබා බලාවි. ඒ සියල්ලම මල් වතුයි. මල් වත්ත බැලීමට යාමට වුවමනා වූ විට ඔවුන් කියනවා: බාබා, බාබා මම මධ්‍යස්ථාන කිහිපයකට ගිහින් ඒ ඒ මල් කොයි වගේද මොන විදියේ සේවයක්ද කරන්නේ කියා ගිහින් බලන්නම්. එසේ ගියහොත් පමණයි ඔබට ඔවුන් සතුටින් නටනා ආකාරය දැක ගත හැකි වන්නේ. ඔවුන් බාබා ළඟට පැමිණ කියනවා: බාබා, මම මේ කෙනාට මේ මේ විදියට පැහැදිලි කළා. අද මම මගේ සැමියාවත් සහෝදරයාවත් එක් කරගෙන ආවා. බාබා පැමිණ සිටින්නේ කෙසේද, ඔහු අපගේ ජීවිත දියමන්ති මෙන් වටිනා ජීවිත කරවන්නේ කෙසේද කියා මම ඔහුට කියා දුන්නා. මේවා ඇසෙන විට ඔවුන්ටත් එය දැක ගැනීමට අවශ්‍ය වේවි. එමනිසා, දරුවන් තුළ උද්යෝගය ඇති විට ඔවුන් අනෙක් අයවත් ගෙන එනවා. ලෝකයේ ඉතිහාසය හා භූගෝලය ඔබ දැන සිටිය යුතුයි.භාරතය මුලු ලෝකයටම පාලකයා වී සිටියේ කෙසේද කියා ඔබටස දැන ගත හැකියි. දැන් එහි තත්ත්වය දෙස බලන්න. ස්වර්ණමය හා රිදී යුග වලදී විශාල සතුටක් තිබුණා. බාබා දැන් ඔබව නැවතත් වතාවක් ලෝක බාලකවරුන් කරවනවා. අවසානයේදී මුලු ලෝකය පුරාම මහත් ව්‍යසන ඇති වන බව ඔබලා දන්නවා. යුද්ධය නතර වන්නේ නැහැ. දිගින් දිගටම කොහේ හෝ තැනක යුද්ධ සිදු වෙනවා. බලන බලන තැන රණ්ඩු. සැම තැනකම විශාල ආරවුල්. පිටරට වල සිදු වන දේ දෙස බලන්න. තමන් කරන්නේ කුමක්ද කියාවත් ඔවුන්ට තේරෙන්නේ නැහැ. කුණාටු ගණනාවක් ඇති වී මිනිස්සු මියැදෙනවා. මෙය දුකින්ම පිරි ලෝකයක්. තමන් දැන් මේ දුකින් පිරි ලෝකය අතහැර යාමට සිටිනා බව ඔය දරුවන් දන්නවා. බාබා ඔබට ඉවසීම දෙනවා. මෙය ජරාජීර්ණ වූ ලෝකයක් බවත් කෙටි කලකින්ම අපි සාමකාමීව ලෝකය පාලනය කරන්න යන බවත් ඔහු ඔබට කියනවා. ඔබට මේ ගැන සතුටු සිතිය යුතුයි නේද? දිගටම මධ්‍යස්ථාන විවෘත වෙනවා. අලුත් මධ්‍යස්ථාන විවෘත වන විට බාබා හොඳ දරුවන්ට ඒ තැන් වලට යන්න කියනවා. බාබා තම හද සිහසුනේ අසුන් ගෙන සිටිනා අයගේ නම් ලියනවා. බොහෝ දෙනෙකුට යහපත සැලසෙනවා. බොහෝ දරුවන් ලියනවා: බාබා මම බන්ධන වල හිර වෙලා. හොඳ මධ්‍යස්ථානයක් කොහේ හෝ විවෘත වෙනවා නම් බොහෝ දෙනෙකුට එහි ගොස් තම උරුමය දිනා ගත හැකියි. මේ සියල්ල විනාශ වීමට යන බව ඔබලා දන්නවා. ඉතින් ඇයි තමා සතු සැම දෙයක්ම සැම කෙනෙකුටම යහපත සැලසීමට යොදවන්නේ නැත්තේ? නාටකයේ කොටස එහෙමයි. ඔබ සැම කෙනෙක්ම තම තමන්ගේ චරිත කොටස රඟ දක්වනවා. ඔවුන්ට අනුකම්පාව දක්වනවා. බන්ධන වලින් මිදීමට මම අනිත් අයටත් ටිකක් උදව් කරන්නම්. ඔවුන්ටත් තම උරුමය දිනා ගත හැකි වේවා. සැම කෙනෙකුම රාග ගින්නේ දැවෙමින් සිටිනා නිසා පරමාත්ම පියා ඒ ගැන හරි සැලකිල්ලෙනුයි සිටින්නේ. මුලු ලෝකයම සොහොන් බිමක් වෙලා. අල්ලා පැමිණ සොහොනේ නිද්‍රාව සිටිනා සැම කෙනෙක්වම අවදි කරවා ආපසු නිවසට ගෙන යනවා කියා කියනවා. රාවන ඔබව පැරදවූයේ කෙසේද කියා ඔබ දන්නවා. මීට පෙර ඔබ මෙය තේරුම් ගත්තේ නැහැ. කෝටිපති මැණික් ව්‍යාපාරිකයෙක්ව සිටි ඔබට දරුවන් රැසක්ද සිටියා. ඒ සතුට ඔබට ඇති නේද? තමන් සිටියේ ඉතාමත් අපිරිසිදුවට කියා ඔබට දැන් තේරෙනවා. මෙම පැරණි ලෝකයේ කෙනෙක් කෙතරම් ලක්ෂපතියෙක් හෝ කෝටිපතියෙක් වුවත් ඒ සියල්ල සිප්පි කටු වගේයි. එය දැන් විනාශ වීමටයි යන්නේ. මායාත් ඉතාමත් බලවත්. පරමාත්ම පියා කියනවා: දරුවනි, මධ්‍යස්ථානයක් විවෘත කරන්න. බොහෝ දෙනෙකුට යහපත සැලසේවි. දුප්පත් අය ඉක්මනින්ම අවදි වෙනවා. නමුත් ඉතාමත් කලාතුරකින් තමයි ධනවත් කෙනෙක් අවදි වන්නේ. ඔවුන් තම තමන්ගේම සතුටේ ගැලී සිටිනවා. මායා ඔවුන්ව මුළුමනින්ම අල්ලාගෙන. පැහැදිලි කළ විට ඔවුන් එය අවබෝධ කර ගත්තත් කොහොමද අත්හරින්නේ? අප මෙන්ම ඔවුන්ටත් සියල්ල අත්හැරීමට සිදු වේවියි කියා ඔවුන් බය වෙනවා. ඔවුන්ගේ වාසනාවේ මෙය නැතිනම් කොහොමද ඔවුන් ඉදිරියට යන්නේ. ඉන් මිදීමට නම් ඔවුන්ට ඉතාමත් අපහසු දෙයක් වගේයි. දැනට ඔවුන් කිසිම දෙයක් කෙරෙහි ආශාවකින් තොරව සිට පසුව මෙය ජරාජීර්ණ වුණු ලෝකයක් බව ඔවුන් සැබවින්ම අවබෝධ කර ගනීවි. කෙසේ වෙතත්, එහි දේවල් එහිම අතහැර දමා යාවි. සිය දහසක් අතුරින් ඉතාමත් සුළු පිරිසක් පමණයි මතු වන්නේ. බොම්බේ නුවරට සිය දහස් ගණනින් සෙනඟ පැමිණෙනවා. ඔවුන්ගෙන් කිහිප දෙනෙක් මින් වර්ණවත් වෙනවා. තමන් සිප්පි කටු වෙනුවට දියමන්ති ලැබීමට නම් අනාගතය සඳහා යමක් කළ යුතුයි කියා සිතනවා. පරමාත්ම පියා පැහැදිලි කර කියනවා: ඔබගේ සියලුම ගමන් මලු දැන් පිටත් කර යවන්න. එහිදී ඔබට උපත් 21 ක රාජධානියක් හිමි වේ. ඇතැම් අය රුපියලක් නැතිනම් සත පනහක් වුවත් එවනවා. පරමාත්ම පියා කියනවා: ඔබගෙන් එක් රුපියලක් හෝ ශිව බාබාගේ නිදන් ගබඩාවට එකතු වුවහොත් උපත් 21 කට ඔබට මාළිගාවක් හිමි වනු ඇත. සුදාමාගේ ආදර්ශ කතාව තිබෙනවා. එවන් දරුවන් දැකීමෙන් බාබා ඉතාමත් සතුටට පත් වෙනවා. ඔය දරුවන් කිසිම වියදමකින් තොරව ලෝක ආධිපත්‍යය ලබනවා. මෙහි කිසිම සටනක් නැහැ. ඒ පුද්ගලයින් කුඩා බිම්

අහලක් වෙනුවෙන් සටන් වදිනවා. ඔබට ඉතාමත් සරළව කියන්නේ: මන්මනාභව. එපමණයි. මෙහි පැමිණීමේ අවශ්‍යතාවයක් නැහැ. යන එන අතරතුර, වැඩපළ කරනා ගමන් පරමාත්ම පියාවත් උරුමයත් සිහි කරන්න. සතුට රඳවා ගන්න. ඔබගේ කෑම බීම පිරිසිදු විය යුතුයි. තමනුත් රාජකුමාරයෙක් සේ ඉපදීමට නම් කොයි තරම් දුරට පරිශුද්ධ විය යුතුද කියා ඔය ජීවාත්මයන්ට දැන් තේරෙනවා. ඔබ තව තවත් ඉදිරියට යන විට ලෝකයේ තත්ත්වය තව තවත් නරක අතට හැරෙනවා. කෑමට ගැනීමට ප්‍රමාණවත් දෙයක් නොමැතිව ඔබට තණකොළත් කෑමට සිදු වේවි. බටර් නැතිව කන්න බැහැයි කියා එවිට ඔබ කියනා එකක් නැහැ. ඔබට කිසිම දෙයක් ලැබෙනා එකක් නැහැ. දැනටමත් බොහෝ තැන් වල මිනිසුන් හුදෙක් තණකොළම කා ජීවත් වෙනවා. ඔබලා බාබාගේ ගෙදර හොඳ සැපට සිටිනවා. ගෙදරකදිත් පියෙක් තම දරුවන්ට පළමුව කන්න දෙනවා. දැන් ලෝකය ඉතාමත් නරකයි. ඔබලා මෙහි මහත් සතුටකින් සිටිනවා. පරමාත්ම පියාවත් උරුමයත් පමණක් සිහිපත් කරන්න. තමාටත් අන් අයටත් යහපත සලසා ගන්න. පසුව ඔවුන්ම පැමිණේවි. ඔවුන්ගේ වාසනාව අවදි වෙලා. එය අවදි විය යුතුයි. අසීමිත රාජධානිය ස්ථාපනය විය යුතුයි. ඔබ සෑම කෙනෙක්ම තම තමන් පෙර කල්පයේ කළ ආකාරයෙන්ම පැමිණ උත්සාහ දරනවා. ඔය දරුවන් විශාල සතුටකින් සිටිය යුතුයි. බාප්දාදාගේ පින්තූරය දුටු සැනකින්ම ඔබට හිරිගඩු පිපෙනා සතුටක් ඇති විය යුතුයි. ඒ සතුටේ රසදිය කඳ දිගටම ඉහළින්ම පැවතිය යුතුයි. අච්චා.

සුමිහිරි, ආදරණීය බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. සදාකල් රැඳෙනා සතුට පවත්වා ගැනීමට නම් මෙම අසීමිත ඥානය ඔබගේ සිහියේ තබා ගෙන සිටින්න. ඥාන මිණිමුතු වලින් ඔබගේ ඒප්‍රන පුරවා ගනිමින් ඔබටත් අන් අයටත් යහපත සලසන්න. මෙම ඥානයෙන් ඉතාමත්ම දක්ෂ අයෙක් වන්න.
2. අනාගත උපත් 21 සඳහා ඔබගේ රජ දහනේ වාසනාව දිනා ගැනීමට නම් ඔබ සතු සියලුම ගමන් මලු පිටත් කර යවන්න. මෙම කිලිටි ලෝකයෙන් මිදීමට ක්‍රම විධි සොයා ගන්න.

**වරදානය:** ඔබ එකම එක පියා කෙරෙහි සෙනෙහසින් ඒකාබද්ධ වී, නිරන්තරයෙන් ආරෝහන අවධිය අත්විඳීමෙන්, සාර්ථකත්වයේ ප්‍රතිමූර්තියක් වේවා.

සේවයේ සාර්ථකත්වයේ සහ ඔබේ ආරෝහන අවධියේ ප්‍රධාන පදනම වන්නේ පරමාත්ම පියා කෙරෙහි නොබිඳුණු සෙනෙහසක් තිබීමයි. එකම එක පියා හැර අන් කිසිවක් දැකීමට ඔබට ඉඩ නොදෙන්න. ඔබේ සිතුවිලි වල බාබා, ඔබේ වචන වල බාබා සහ ඔබේ ක්‍රියාවන්හි බාබාගේ ඇසුර (සමාගම) ද තබා ගන්න. සෙනහසින් ඒකාබද්ධ වූ ජීවාත්මයක් එක් වචනයක් හෝ පවසන විට, එම සෙනහසේ වචනය අනෙකුත් ජීවාත්ම ද සෙනහසේ බැඳීමකින් බැඳ තබයි. සෙනහසින් ඒකාබද්ධ වූ එවැනි ජීවාත්මයන්ගෙන් එන "බාබා" යන එක වචනය මැජික් මෙන් ක්‍රියා කරයි. ඔවුන් ආධ්‍යාත්මික ඉන්ද්‍රජාලිකයන් වේ.

**පාඨය:** යෝගී ජීවාත්මයක් යනු ආලෝකයේ සහ බලයේ ස්වරූපයෙන් අභ්‍යන්තරික සහ ස්ථාවර වූ අයෙකි.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයෙ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නිර්භීතව හා බාධක වලින් නිදහස්ව සිටින්න.**

ඔබට ලබා දී ඇති රාජකාරියේ නිරන්තරයෙන් නිරවද්‍යාව සිටින්න. සෑම කෙනෙකුම තම රාජකාරි වල නිරවද්‍යාව සිටින අයව විශ්වාසවන්තයින් ලෙස දකී. මෙහිදීද, තමන් කරන සේවයේ නිරවද්‍යාව සිටින අය පරම පියාට විශ්වාසවන්තයි. එකක් නම් පරමාත්ම පියා කෙරෙහි සම්පූර්ණ ශ්‍රද්ධා විශ්වාසයක් තබා ගැනීම වන අතර අනෙක ඔබ කරන සේවයේදී පරමාත්ම පියාට විශ්වාසවන්තව සිටීමයි. විශ්වාසය ඇති එවැනි විශ්වාසවන්ත දරුවන් නිරන්තරයෙන් ජයග්‍රාහී වන අතර ඔවුන් බාධක වලින් නිදහස්ව සිටිති.